SRI LANKA
CONVENTION BUREAU

# සංචාරක සහ ඉඩම් අමාත්‍යාංශය
## ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය

# පුරප්පාඩු

සංචාරක සහ ඉඩම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය (SLCB) රැස්වීම්, පෙළඹුම් සංචාර, සම්මන්ත්‍රණ සහ ප්‍රදර්ශන සහ උත්සව සංවර්ධනය කිරීමට භාර දී ඇති ව්‍යවස්ථාපිත ආයතනයකි. SLCB පහත තනතුරු සඳහා සුදුසුකම් ලත් අපේක්ෂකයන්ගෙන් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

## සහකාර කළමනාකරු (අභ්‍යන්තර විගණන) තනතුර

### බාහිර අපේක්ෂකයන් (පහත 1 හෝ 2 හෝ 3 )

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද මූල්‍ය/ගිණුම්කරණ/වාණිජ්‍යය/මූල්‍ය කළමනාකරණ උපාධියක් සහ එම උපාධිය ලබා ගැනීමෙන් පසු කළමනාකරණ මට්ටමේ විගණන තනතුරක අවම වශයෙන් වසර එකක පළපුරුද්ද.

02. පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මාධ්‍ය විභාගය සමත්ව තිබීම (ICASL/CIMA/ACCA හෝ අදාළ වෙනත් වෘත්තීය ආයතනයක මෙයට සමාන සුදුසුකමක්) සහ එම සුදුසුකම ලැබීමෙන් පසුව රාජ්‍ය සේවයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක විගණන ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමක අවම වශයෙන් වසර එකක පළපුරුද්ද.

03. ගිණුම්කරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව ලබා තිබීම සහ එම සුදුසුකම ලැබීමෙන් පසුව රාජ්‍ය සේවයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක විගණන ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමක අවම වශයෙන් වසර එකක පළපුරුද්ද.

### අභ්‍යන්තර අයදුම්කරුවන්

ඉහත සඳහන් කළ බාහිර අයදුම්කරුවන් විසින් සැපිරිය යුතු සුදුසුකම් ලබා තිබීම.

**වයස :** අයදුම්පත්‍ර භාරගැනීමේ අවසන් දිනට අවුරුදු 22 ට නොඅඩු අවුරුදු 45ට නොවැඩි විය යුතුය අභ්‍යන්තර අපේක්ෂකයන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් පරිමාණය :** රු. 54,550/- 10 x 1,375 -15 x 1,910/= - 96,950/= (MM 1-2)

**මූලික පියවර :** රු. 54,550/- + ජීවන වියදම් දීමනාව + වෙනත් මාසික දීමනා

## සහකාර කළමනාකරු (ආයතනික, දිරිගැන්වීම් සහ සිදුවීම්) තනතුර

### බාහිර අයදුම්කරුවන්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද විශ්වවිද්‍යාලයකින් අලෙවිකරණය/ වාණිජ්‍යය/ උත්සව කළමනාකරණය/ සංචාරක කළමනාකරණය/ ව්‍යාපාර පරිපාලනය/ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳව මූලික උපාධියක් ලබා තිබීම සහ එම සුදුසුකම ලබා ගැනීමෙන් පසුව අවම වශයෙන් රාජ්‍ය සේවයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් අලෙවි ආයතනයක ආයතනික උත්සව, සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ උත්සව සහ පෙළඹුම් උත්සව සම්බන්ධව කටයුතු කිරීමේ කළමනාකරණ මට්ටමේ වසර එකක පළපුරුද්දක් තිබීම.

අලෙවිකරණය පිළිබඳ වරලත් ආයතනයේ වෘත්තීය පශ්චාත් උපාධි ඩිප්ලෝමාව අමතර සුදුසුකමක් ලෙස සැලකෙනු ඇත.

### අභ්‍යන්තර අයදුම්කරුවන්

ඉහත සඳහන් කළ බාහිර අයදුම්කරුවන් විසින් සැපිරිය යුතු සුදුසුකම් ලබා තිබීම.

**වයස :** අයදුම්පත්‍ර භාරගැනීමේ අවසන් දිනට අවුරුදු 22 ට නොඅඩු අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් පරිමාණය :** රු. 54,550/= 10 x 1,375 -15 x 1,910/= - 96,950/= (MM 1-2)

**මූලික පියවර :** රු. 54,550/= + ජීවන වියදම් දීමනාව + වෙනත් මාසික දීමනා

## කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන තනතුර

### බාහිර අයදුම්කරුවන්

අ.පො.ස (සා/පෙ) විභාගයෙන් සිංහල/දෙමළ, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළු විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ ඇතුළුව එක් වරකදී විෂයයන් හයක් සමත් වී තිබීම සහ අ.පො.ස. (උ/පෙ) වාණිජ අංශයෙන් හදාරා විභාගයෙන් විෂයයන් තුනම සමත් වීම (පොදු ප්‍රශ්න පත්‍රය හැර)

### අභ්‍යන්තර අයදුම්කරුවන්

පහත සුදුසුකම්වලින් සමන්විත ප්‍රාථමික - පුහුණු, ප්‍රාථමික - අර්ධ පුහුණු සහ ප්‍රාථමික - නුපුහුණු කාණ්ඩවල සේවකයන් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

අ.පො.ස (සා/පෙ) විභාගයෙන් සිංහල/දෙමළ, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළු විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ ඇතුළුව එක් වරකදී විෂයයන් හයක් සමත් වී තිබීම සහ ඉහත සේවා කාණ්ඩය යටතේ ස්ථිර තනතුරක අවම වශයෙන් වසර පහක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස :** අයදුම්පත්‍ර භාරගැනීමේ අවසන් දිනට අවුරුදු 18 ට නොඅඩු අවුරුදු 45ට නොවැඩි විය යුතුය අභ්‍යන්තර අපේක්ෂකයන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් පරිමාණය :** රු. 27,910/- 10 x 300- 7 x 350 - 12 x 600 - 12 x 710 - 49,080 (MA 1-2)

**මූලික පියවර :** රු. 27,910/- + ජීවන වියදම් දීමනාව + වෙනත් මාසික දීමනා.

## රියැදුරු තනතුර

### බාහිර අයදුම්කරුවන්

අ.පො.ස. (සා/පෙ) විභාගයෙන් උපරිම වාර දෙකකදී සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් හයකින් සමත් වීම සහ රියැදුරෙකු ලෙස අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්ද සහිතව බර වාහන පැදවීම සඳහා මෝටර් රථ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බලපත්‍රය ලබා තිබීම.

### අභ්‍යන්තර අයදුම්කරුවන්

රියැදුරෙකු ලෙස අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්ද සහිතව බර වාහන පැදවීම සඳහා මෝටර් රථ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බලපත්‍රය ලබා තිබීම සහ ප්‍රාථමික නුපුහුණු (PL1) සේවා කාණ්ඩයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස :** අයදුම්පත්‍ර භාරගැනීමේ අවසන් දිනට අවුරුදු 18 ට නොඅඩු අවුරුදු 45ට නොවැඩි විය යුතුය අභ්‍යන්තර අපේක්ෂකයන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් පරිමාණය :** රු. 26,290/= 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - 39,490 (PL 3)

**මූලික පියවර :** රු. 26,290/= + ජීවන වියදම් දීමනාව + වෙනත් මාසික දීමනා.

**වෙනත්**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
ii. තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතු ය.
iii. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

**ප්‍රතිලාභ**

i. සේවකයා සහ පවුල ආවරණය වන පරිදි විස්තීර්ණ හා ආකර්ශණීය වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයක්.
ii. ණය පහසුකම්
iii. දුරකථන දීමනා (MM 1-2 ශ්‍රේණිය සඳහා)
iv. වෘත්තීය දීමනා (MM 1-2 ශ්‍රේණිය සඳහා)

උනන්දුවක් දක්වන අපේක්ෂකයන්, තම අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම්, සේවා පළපුරුද්ද පෙන්වන සහතිකවල පිටපත් සහ ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහිත තමන් විසින්ම සකසන ලද අයදුම්පත්‍රයක් **2024 ජනවාරි 22 දිනට** පෙර **slcbmice@gmail.com** ඊමේල් ලිපිනය වෙත හෝ ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට යොමු කළ යුතු ය. කරුණාකර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ ඔබ අයදුම් කරන තනතුර සඳහන් කරන්න.

රජයේ දෙපාර්තමේන්තු/ රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අපේක්ෂකයන් තම අයදුම්පත්‍ර අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් යොමු කළ යුතු ය.


**සභාපති,**
**ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය,**
**4 වන මහල, හෝටල් පාසල් ගොඩනැගිල්ල, අංක 78, ගාලු පාර,**
**කොළඹ 03.**


SEL ACINE